# අටුගොඩ ගම ආශ්‍රයෙන් සාම්ප්‍රදායික කම්හල් කර්මාන්තයේ භාවිත වන මෙවලම් පිළිබඳ අධ්‍යයනය

ඩබ්ලිව්. එන්. නදීකා චන්ද්‍රමාලී නවරත්න*

අටුගොඩ ගම ආශ්‍රයෙන් සාම්ප්‍රදායික කම්හල් කර්මාන්තයේ දී භාවිත වන මෙවලම් පිළිබඳ කල අධ්‍යනයේ දී මාගේ අරමුණ වූයේ පැරණි කම්හල් කර්මාන්තයේ දී භාවිතා කල උපකර්ණ පිළිබඳ අධ්‍යනයයි. මෙහිදී ගමතුල පවතින කම්හල් ආශ්‍රයෙන් දත්ත වාර්ථා කළෙමි. කෑගල්ල දිස්ත්‍රික්කයේ ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨශයේ අටුගොඩ ගම පිහිටා ඇත. අතීතයේ රජුට යුධ කටයුතුවලට අවශ්‍ය අවිආයුධ මෙම ප්‍රදේශයේ නිෂ්පාදනය කල බව ජනප්‍රවාදයයි. වර්තමානයේද ගම හා අවට කම්හල් කිහිපයක් ඇත. ඒවායේ එදිනෙදා අවශ්‍යතා සඳහා වානේ ආශ්‍රිත නිශ්පාදන කරනු ලබයි. අතීතයේ දී කරත්තවල පට්ටම් දැමීම සිදු කොට ඇත. කම්හල් කර්මාන්තයේදී භාවිත වන්නේ "වානේ" නම් ලෝහයයි. එම ලෝහයේ මුවහත් බව අධිකය. එම ලෝහය මූලිකවම අවශ්‍ය ලෙස පදම් කොට හැඩ කපා ගැනීමට රත් කිරීම අවශ්‍ය වේ. සඳහා උෂ්ණය නම් උදුනත් එයට ගින්දර අවශ්‍ය ලෙස පාලනය කීරීමට අවශ්‍ය සුළං ලබා දීමට මහිනහම නම් සුළං පාලක උපකර්ණයක් යොදා ගනු ලබයි. මෙහි දී ගින්දර ලබා ගනීමට ඉන්දන වශයෙන් පොල් කටු අඟුරු භාවිතා කරනු ලබයි. රත් කල යකඩ අවශ්‍ය ලෙස තලා, හැඩ කපා ගැනීමට කිණිහිරිය නම් ලී කණුවක් මත තබන ලද යකඩ වේදිකාවක් වැනි උපකර්ණයත් ඒ සඳහා බෝල මිටිය, කුළු ගෙඩිය හා විවිධ මිටි වර්ග ද හැඩ කපා ගැනීමට කපන කටුව යන උපකර්ණයක් යොදා ගනී. තවද රත් යකඩ අල්ලා ගැනීමට කම්හල් අඬු හා නැමි අඬු යොදා ගනී.

අවශ්‍ය හැඩ කපා සකස් කල මෙවලලෙහි මුවහත් කීරීමට ඒවා රඳවා ගැනීමට දඬුඅඬුව නම් උපකර්ණයක් යොදා ගනී. ඒ සඳහා විවිධ පීරි වර්ග යොදා ගනී. මිටක් සහිත මෙවලම් නිෂ්පාදනේ දී මිට සකස් කීරීමට එහි අනවශ්‍ය කොටස් ඉවත් කිරීමට වප් පිහිය, කියත් වර්ග හා තෝරපණය නම් උපකර්ණ යොදා ගනී. මිටෙහි සිදුරක් විද ඇණ යෙදීමට බුරුමය හා පුල්ලෝරමය උපකර්ණ යොදා ගනී. කම්හලේ විවිධ කටයුතවලට අවශ්‍ය ජලය ලබා ගනීමට කම්හල් ඔරුව භාවිතා කරයි. ලිපෙහි අඟුරු පාලනය කීරීමට අඟුරු කොක්ක උපකර්ණයක් යොදා ගනී. කම්හල් කර්මාන්තයේදී යොදා ගන්නා සුවිශේෂී වදන් වශයෙන් වානේ පදම් කීරීමට කුළු ගෙඩියෙන් පහර දීම "කුළු ගැසීම" වේ. මෙවලමක් හොඳින් මුවහත කීරීමට රත් කොට ජලය තුල යෙදීම "පන්නරය තැබීම" වේ. කම්හලේ ප්‍රධාන හිමිකරුවා "ගුරුන්නාන්සේ" වේ. අතීත ජන උරුමයෙන් හිමි වූ කම්හල් කර්මාන්තය වර්තමානය වන විට අභාවයට යාමේ අවධානමක පවතින අතර එමෙන්ම වර්තමානයේ නවීන උපකර්න භාවිතා වේ. එබැවින් එම අතීත උරුමය රැක ගැනීම අප සතුය.

ප්‍රමුඛ පද - කම්හල් කර්මානතය, මෙවලම්, සාම්ප්‍රදායික, අටුගොඩ ග්‍රාමය

* පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය